**උඩපළාත ප්‍රාදේශීය සභාව**
**මහනුවර දිස්ත්‍රික්කය**
**-----------------------------------------**

**1. <u>මූල්‍ය ප්‍රකාශන</u>**

**1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 27 දින ද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>**

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට උඩපළාත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>**

**1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------- | ------------- | ---------------------------- |
| (අ) | 2018 වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂයේ ලද රු.330,277 ක උසාවි දඩ වටිනාකම ලැබිය යුතු උසාවි දඩ ලෙස හඳුනා ගෙන තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දී, ලැබිය යුතු මුද්දර ගාස්තු වටිනාකම රු.1,107,836 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ජ'නල් සටහන් මඟින් ගිණුම්ගත කරමි. |
| (ඇ) | ඉකුත් වර්ෂවල කර්මාන්ත ණයහිමි කළ වටිනාකමත්, පියවීමත් අතර වෙනස වූ රු.126,767 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ජ'නල් සටහන් මඟින් ගිණුම්ගත කරමි. |
| (ඈ) | වර්ෂය තුළ මිලදී ගත් රු.70,400 ක් වටිනා වානේ කැබිනට් 02 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ජ'නල් සටහන් මඟින් ගිණුම්ගත කරමි. |
| (ඉ) | ලැබිය යුතු රු.654,700 ක් වූ දැන්වීම් පුවරු ගාස්තු ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී ගිණුම්ගත කරමි. |

**1.3.2 <u>නොසැසඳුනු ගිණුම්</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------ | ----------------------------- |
| මූල්‍ය ප්‍රකාශන අනුව, ගිණුම් විෂයයන් 02 ක ශේෂ හා උපයෝගී ලේඛන අතර රු.244,855,474 ක නොසැසඳීමක් විය. | වෙනස්කම් සසඳා නිවැරදි කිරීම් කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම සැකසීමේ දී නිවැරදි කරමි. |

**1.3.3 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) <u>ලැබිය යුතු ගිණුම්</u><br>අවුරුදු 05 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂ එකතුව රු.1,017,587 ක් හා අවුරුදු 01 ත් 05 ත් අතර කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.293,677 ක් විය. | අය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ඉදිරියේ දී අය කර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) <u>ගෙවිය යුතු ගිණුම්</u><br>අවුරුදු 05 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂ එකතුව රු.956,809 ක් හා අවුරුදු 01 ත් 05 ත් අතර කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.491,682 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී නිරවුල් කිරීමට කටයුතු කරමි. |

**1.3.4 <u>විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම තොරතුරු ඉදිරිපත් නොකිරීම</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතුව රු.496,010 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් සඳහා ලේඛන හා ලිපිගොනු ආදිය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.3.5 <u>අනුකූල නොවීම</u>**

**1.3.5.1 <u>නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>**

| | නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| | XIX වැනි පරිච්ඡේදයේ 7.1 වගන්තිය | විශ්‍රාමික නිලධාරීන් තිදෙනෙකුගෙන් නිල නිවාසවල සන්තකය පවරා ගැනීමට හා නිවාස කුලි අය කිරීමට කටයුතු කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ නියමයන් අනුව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවාස පවරා ගැනීමට හා කුලි අය කිරීමට කටයුතු කරමි. |

(ආ) වෙනත් වක්‍රලේඛ

---------------------

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව

----------------------------

| | | | | |
|---|---|---|---|---|
| (i) | 217 වගන්තිය | ප්‍රා.ස. 46 ආකෘතිය පරිදි සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | මූල්‍ය රීතිවල සඳහන් රෙගුලාසි පරිදි කටයුතු කළ යුතුවේ. | වත්කම් සමීක්ෂණය අවසන් වූ පසු ලේඛනය පවත්වා ගෙන යාමට කටයුතු කරමි. |
| (ii) | 218 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ දී ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් පරීක්ෂාවක් කර නොතිබුණි. | මූල්‍ය රීතිවල සඳහන් රෙගුලාසි පරිදි කටයුතු කළ යුතුවේ. | වත්කම් සමීක්ෂණය අවසන් වූ පසු වාර්තා පිළියෙල කරන බව දන්වමි. |

## 2. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.65,471,340 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.50,298,663 ක් විය.

### 2.2 <u>ආදායම් පරිපාලනය</u>

#### 2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,454,709 | 2,363,786 | 2,287,868 | 4,355,086 | 6,117,000 | 2,917,135 | 2,992,084 | 2,405,485 |
| (ii) | කුලී | 5,694,561 | 4,027,193 | 3,912,775 | 2,289,560 | 3,703,200 | 3,647,760 | 3,203,395 | 2,177,225 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,352,750 | 2,027,068 | 1,964,668 | 312,000 | 1,955,100 | 1,856,875 | 1,687,675 | -- |
| (iv) | වෙනත් ආදායම් | 33,985,750 | 29,172,637 | 76,273,568 | 6,215,168 | 37,857,500 | 32,685,098 | 12,686,564 | 53,268,554 |
| | එකතුව | 44,487,770 | 37,590,684 | 84,438,879 | 13,171,814 | 49,632,800 | 41,106,868 | 20,569,718 | 57,851,264 |

#### 2.2.2 <u>වරිපනම් හා බදු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වරිපනම් | | |
| (i) සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.3,477,686 ක වරිපනම් ශේෂයක් අය කර ගත යුතුව පැවතුණි. | අය විය යුතු වරිපනම් අය කළ යුතුවේ. | හිඟ හිටි ශේෂ අය කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ii) | සමාලෝචිත වර්ෂය අවසානයට රජයේ දේපළවලින් අය විය යුතු රු.52,861 ක් අය කර නොතිබුණි. | හිඟ අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී වැරදි බිල් කිරීම් නිවැරදි කිරීමට ද, හිඟ ශේෂ අය කිරීමට ද කටයුතු කරමි. |
| (ආ) | අක්කර බදු<br>-------------- | | |
| | සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතු රු.64,219 ක් අය කර නොතිබුණි. | හිඟ හිටි අක්කර බදු අය කර ගත යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | ජල බදු<br>---------- | | |
| | සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතු රු.2,118,950 ක් අය කර නොතිබුණි. | හිඟ ආදායම් අය කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

### 2.2.3 <u>කුලී</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | -------------- | -------------------------------- |
| කඩ කුලී<br>----------- | | |
| සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතු රු.1,983,840 ක් අය කර නොතිබුණි. | හිඟ කඩ කුලී අය කර ගත යුතුවේ. | අධිකරණයේ නඩුවක් පවතින බැවින්, එහි විසඳුම් අනුව ක්‍රියාමාර්ග ගන්නා බව දන්වමි. |

### 2.2.4 <u>වෙනත් ආදායම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | ------------- | ------------------------------- |
| සම්ප්‍රේෂණ කුළුණු ආදායම්<br>-------------------------------- | | |
| සමාලෝචිත වර්ෂය අවසානයට කුළුණු 17 කින් අය විය යුතු රු.69,,000 ක් අය කර නොතිබුණි. | හිඟ ආදායම් අය කළ යුතුවේ. | නඩු පැවරීමට කටයුතු කරමි. |

### 2.2.5 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------- | ------------- | -------------------------------- |
| 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.422,560 ක් හා මුද්දර ගාස්තු රු.45,493,575 ක් විය. | ගාස්තු අය කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ප්‍රමාණවත් පරිදි ඉටු නොකළ කාර්යයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට වැය විෂයයන් 05 ක් සඳහා වෙන් කර තිබූ රු.380,000 ක් අදාළ කාර්යයන් වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි. | ප්‍රතිපාදන අරමුණු සඳහා උපයෝජනය කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් බල ප්‍රදේශයේ මහජනතාව වෙනුවෙන් විවිධ වූ කාර්යයන් ක්‍රියාත්මක කරන නමුත්, ඒවා තිරසර සංවර්ධන ඉලක්ක සමඟ කෙසේ ගැළපේ ද, යන්න පිළිබඳ ඇගයීමක් හා පසු විපරම් ක්‍රියාවලියක් සිදු කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු අත්පත් කර ගැනීම පිළිබඳ පසු විපරමක් කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අක්‍රියව පවතින ජල මූලාශ්‍ර 07 ක් විධිමත් පරිදි අලුත්වැඩියා කර මහජනතාවට ප්‍රතිලාභ ලබා දීමට කටයුතු කර නොතිබුණි. | ජල මූලාශ්‍ර වැඩි දියුණු කිරීමට කටයුතු කළ යුතුවේ. | ජල සමීක්ෂණයක් කඩිනමින් සිදු කර ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව දන්වමි. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත | | |
| 2019 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සේවක සංඛ්‍යාව තුළ පුරප්පාඩු 14 ක් පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කළ යුතුවේ. | අනුමැතිය ඉල්ලා ඇති අතර, ඉදිරියේ දී බඳවා ගැනීමට කටයුතු කරමි. |

(ආ) සේවක ණය

| | | |
|---|---|---|
| (i) 2014 වර්ෂයේ සිට සේවකයින් 09 දෙනෙකුගෙන් අය විය යුතු රු.79,819 ක ණය ශේෂයක් අය කර නොතිබුණි. | ණය මුදල් අය කිරීමට කටයුතු කළ යුතුවේ. | තොරතුරු සොයාගත නොහැකි බැවින්, ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට අපහසු බව දන්වමි. |
| (ii) සමාලෝචිත වර්ෂයේ විශ්‍රාම ගන්නා ලද නිලධාරීන් දෙදෙනෙකුගෙන් අය විය යුතු රු.273,969 ක ණය ශේෂ අය කර නොතිබුණි. | ණය ශේෂ අය කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී අය කර ගැනීමට කටයුතු කරමි. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) අනවසර ඉදිකිරීම්** | | |
| පුස්සැල්ලාව තනායම් භූමියේ අනවසරයෙන් ඉදිකර තිබූ ව්‍යාපාරික ගොඩනැගිල්ලක් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | අනවසර ඉදිකිරීම් සඳහා ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ඉදිරියේ දී, නීත්‍යානුකූලව කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව දන්වමි. |
| **(ආ) දේපළ බදු දීම සම්බන්ධ අඩුපාඩු** | | |
| සභාව සතුව පවතින ඉඩම් 42 ක් මිණුම් කටයුතු සිදු කර නොතිබුණි. | ඉඩම් මැනීම සිදු කළ යුතුවේ. | ස්ථාවර වත්කම් සමීක්ෂණ අවසන් වූ පසු මිණුම් කටයුතු සිදු කරමි. |
| **(ඇ) ත්‍රීරෝද රථ ගාස්තු** | | |
| ත්‍රීරෝද රථ සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | සමීක්ෂණ කටයුතු සිදු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 වත්කම් ලේඛන ගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් රු.54,700,000 ක් වටිනා වත්කම් 37 ක නීත්‍යානුකූල අයිතිය තහවුරු කර ගැනීමකින් තොරව ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර තිබුණි. | අයිතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | සමීක්ෂණය අවසන් වූ පසු අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව දන්වමි. |

**3.5.2 <u>වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවට අයත් මාර්ග 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1)(ආ) වගන්තිය ප්‍රකාරව, දැන්වීම් පළ කර, ප්‍රසිද්ධියට පත් කිරීමට 1998 වර්ෂයෙන් පසුව කටයුතු කර නොතිබූ අතර, 2014 වර්ෂයෙන් පසුව මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීන කිරීම ද සිදු කර නොතිබුණි. | පනතේ නියමයන් පරිදි කටයුතු කළ යුතුවේ. | කඩිනමින් මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීන කර මාර්ග ගැසට් කිරීමට කටයුතු කරමි. |

**3.5.3 <u>වත්කම්වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පාර දෙක පොදු වෙළඳ පොලෙහි පිහිටි සභාවට අයත් ඉඩමේ 2009 වර්ෂයේ අනවසර ලෙස ඉදිකර තිබූ ව්‍යාපාරික ගොඩනැගිල්ලෙන් ආදායම් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | වත්කම් මගින් ලැබිය යුතු ආදායම් අය කර ගත යුතුවේ. | ආදායම් පරීක්ෂක මගින් තක්සේරුවක් ලබා ගෙන ගිවිසුම්ගත වීමට කටයුතු කරමි. |

**3.5.4 <u>නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්</u>**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | පුස්සැල්ලාව පැරණි කාර්යාල ගොඩනැගිල්ල නිෂ්ක්‍රීයව පැවතුණි. | සභාව සතු වත්කම් ප්‍රයෝජනයට ගත යුතුවේ. | ආරක්ෂක වැටක් ඉදිකිරීමට ඉදිරියේ දී කටයුතු කරමි. |
| (ආ) | ට්‍රැක්ටර් රථයක්, ටේලරයක්, යතුරු පැදියක් හා කෘෂ කැබ් රථයක් මාස 08 ත් වර්ෂ 10ත් අතර කාල පරිච්ඡේදයක් තුළ නිෂ්ක්‍රීයව පැවතුණි. | සභාව සතු වත්කම් ප්‍රයෝජනයට ගත යුතුවේ. | ට්‍රැක්ටරය හා ට්‍රේලරය අලුත්වැඩියාව සඳහා යොමු කර ඇති අතර, කැබ් රථය භාර දීමට අදාළ කටයුතු සිදු වෙමින් පවතින බව දන්වමි. |

**3.6 <u>ප්‍රසම්පාදනය</u>**

**3.6.1 <u>ප්‍රසම්පාදන සැලැස්ම</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වර්ෂය තුළ රු.33,755,779 ක ප්‍රාග්ධන වියදම් සභාව දරා ඇති නමුත්, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | ඉදිරියේ දි නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 නොවිසඳී ඇති නිරීක්ෂණ හා පිළිතුරු නොලත් විගණන විමසුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 – 3.4<br>---------------<br>සභා බල ප්‍රදේශයේ පැවති ප්‍රජා ජල ව්‍යාපෘති 19 ක හා සභා ජල ව්‍යාපෘති 14 ක ජල සාම්පල් පරීක්ෂාවක් කර බීමට සුදුසු බවට තහවුරු කර නොතිබුණි. | ජල සාම්පල් පරීක්ෂණයක් සිදු කළ යුතු වේ. | ජල සාම්පල් පරීක්ෂා කිරීමට කටයුතුකරමි. |